සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**COVID 19 - සති පාසල් වැඩසටහන**

නාට්‍ය හා රංග කලාව - **12** ශ්‍රේණිය

දෙවන වාරය - **2020/05/12 – 2020/05/13**

**නිපුණතාව** : **4 . 0** නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම** : **දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය විමසයි. (දේශීය ශාන්ති කර්මවල නාට්‍යමය ලක්ෂණ විමසීම. උඩරට ශාන්ති කර්ම , කොහොඹා කංකාරිය)**

**ක්‍රියාකාරකම** : **කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ විමසමු.**

**කාර්ය පත්‍රිකා 01**

**වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කොහොඹා කංකාරිය ශාන්ති කර්මය හඳුන්වන වෙනත් නමක් වන්නේ ,
   1) දොළහ පාලිය
   2) හැටපස් යාගය
   3) සූනියම් යාගය
   4) මල් මඩුව
   5) සන්නි යකුම
2. දේශීය ශාන්ති කර්ම අතර කොහොඹා කංකාරිය අයත් වනු ලබන්නේ ,
   1) පහතරට සම්ප්‍රදායට
   2) සබරගමුව සම්ප්‍රදායට
   3) උඩරට සම්ප්‍රදායට
   4) රයිගම් සම්ප්‍රදායට
   5) මාතර සම්ප්‍රදායට
3. කොහොඹා කංකාරිය පැවැත්වීමේ ප්‍රධාන අරමුණක් නොවන්නේ ,
   1) පවුලේ අපල උපද්‍රව දුරු කර ගැනීමට
   2) ගමට රටට සශ්‍රීකත්වය උදා කර ගැනීමට
   3) අස්වනු නෙළා ගැනීමෙන් පසුව දෙවියන්ට පින් දීමට
   4) ස්ත්‍රීන්ගේ වඳ භාවය දුරු කොට දරු සම්පත් ප්‍රාර්ථනයට
   5) දුර්භික්ෂ , වසංගත දුරු කොට සෞභාග්‍යය උදා කර ගැනීමට
4. කොහොඹා කංකාරිය ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නේ ,
   1) උඩු නුවර
   2) වැලිගම
   3) යටි නුවර
   4) හාරිස්පත්තුව
   5) දුම්බර

5. කොහොඹා කංකාරියෙහි පුද සෙත් ලබන යක්ෂයෙක් නොවන්නේ ,

1) වැදි යකා
2) කළු යකා
3) සූනියම් යකා
4) වලි යකා
5) කඩවර යකා

කාර්ය පත්‍රිකා 02

1. කොහොඹා කංකාරිය හා බැඳි උපත් කතාව ලියන්න.
2. කොහොඹා කංකාරිය පැවැත්වීමේ අරමුණු 4 ක් ලියන්න.
3. කොහොඹා කංකාරියෙහි ප්‍රධාන නාට්‍යමය ජවනිකා සඳහන් කරන්න.
4. කොහොඹා කංකාරියෙහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ නම් කරන්න.
5. කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ ජවනිකා ඇසුරින් උදාහරණ සහිතව විස්තර කරන්න.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**COVID 19 - සති පාසල් වැඩසටහන**

නාට්‍ය හා රංග කලාව - **12** ශ්‍රේණිය

දෙවන වාරය - **2020/05/14 – 2020/05/15**

**නිපුණතාව : 4 . 0** නාට්‍ය හා රංග කලාව විෂයය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම : 4.4** දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය

**පාඩම : 4.4.5** රට යකුම ශාන්ති කර්මය **(MCQ)**

**කාර්ය පත්‍රිකා 01**

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දේශීය ශාන්ති කර්ම අතර රට යකුම යාගය අයත්වනු ලබන්නේ ,
   1. පහතරට නර්තන සම්ප්‍රදායටය.
   2. උඩරට නර්තන සම්ප්‍රදායටය.
   3. සබරගමු නර්තන සම්ප්‍රදායටය.
   4. කේරළ සම්ප්‍රදායටය.
   5. රයිගම් සම්ප්‍රදායටය.
2. කාන්තාවන් වෙනුවෙන් රඟ දැක්වෙන සුවිශේෂී ශාන්ති කර්මය වන්නේ ,
   1. කොහොඹා යක් කංකාරියයි.
   2. සූනියම් යාගයයි.
   3. රට යකුම යාගයයි.
   4. දහඅට සන්නියයි.
   5. බලි යාගයයි.
3. රට යකුම යාගයෙහි උපන් කතාව වන්නේ ,
   1. විජය රජු හා කුවේණි කතාව
   2. සේරමාන් රජුගේ කතාවයි.
   3. රිද්දි බිසවුන්ගේ කතාවයි.
   4. සංඛපාල රජුගේ කතාවයි.
   5. මැණික්පාල දේවියගේ කතාවයි.

4. රට යකුම යාගයෙහි අරමුණ අතර වන්නේ ,

    1. ගමට , රටට සෙත් පැතීම.
    2. සෞභාග්‍ය හා සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කිරීම.
    3. අස්වනු නෙලා ගැනීමෙන් පසු දෙවියන්ට පිං දීම.
    4. ස්ත්‍රීන්ගේ වඳ භාවය නැතිකොට ඔවුන්ට දරු සම්පත් ලබා දීම.
    5. දුර්භීක්ෂ හා වසංගත රෝග සුව කිරීම.

5. වම්පස ඡායාරූපයෙන් දැක්වෙන්නේ ,



    1. වඩිග පටුනේ එන අවස්ථාවකි.
    2. සූනියම් යක්ෂණියගේ පැමිණීමයි.
    3. දරු නැලවිල්ලයි.
    4. දොළහ පෙළපාලියේ එන අවස්ථාවකි.
    5. කඩවතතරණයයි.

**කාර්ය පත්‍රිකා 02**

**කෙටි ප්‍රශ්න**

1. රට යකුම යාගය අයත් සම්ප්‍රදාය නම්කර ප්‍රචලිත ප්‍රදේශ ලියන්න.
2. රට යකුම යාගය හා බැඳි උපත් කතාව ලියන්න.
3. රට යකුමෙහි එන අරමුණු 4 ක් ලියන්න.
4. රට යකුම යාගයේ එන නාට්‍යමය අවස්ථා මොනවාද?
5. රට යකුමෙහි එන රංග භූමි අලංකරණය කෙටියෙන් හඳුන්වන්න.

**රචනාමය ප්‍රශ්න**

1. රට යකුම යාගයෙහි එන නාට්‍යමය අවස්ථාවන් තුළ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව විමසන්න.
2. "රට යකුම යාගය කාන්තාවන් වෙනුවෙන් රඟ දක්වති." විමසන්න.
3. රට යකුම යාගයෙහි එන මනෝවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳ ඔබේ අදහස් දක්වමින් විමසන්න.